වලිකාමම් - උතුර ප්‍රාදේශීය සභාව

යාපනය දිස්ත්‍රික්කය

-------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම.

-----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 25 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2012 අප්‍රේල් 04 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 23 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කර ඇත.

1.2 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

(අ) වත්කම්, ආදායම්, වියදම් හා වගකීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දක්වා ඇත.

2012

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | වත්කම් | | ආදායම් | | වියදම් | | වගකීම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. |
| අඩුවෙන් දැක්වීම් | - | - | 02 | 1,058,718 | - | - | - | - |
| වැඩියෙන් දැක්වීම් | - | - | 01 | 2,750,496 | 01 | 30,000 | 04 | 375,081 |
| වර්ගීකරණ දෝෂ | 01 | 21,702 | - | - | - | - | - | - |

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු.19,083,300 ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සත්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ වියදම් අතිරික්තය රු.17,554,756 ක් වූ අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.17,631,200 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) අයවැය ඇස්තමේන්තු නිසි පරිදි පිළියෙල කර නොතිබුණි. එබැවින් අයවැයගත ආදායම සහ තථ්‍ය ආදායම අතර රු.266,812 ක වෙනසක් ද, අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර රු.6,614,448 ක වෙනසක් ද විගණනයේදි නිරික්ෂණය විය.

(ආ) වැඩසටහන් ක්‍රියාත්මක නොකිරිම නිසා මුදල් පොත අනුව බැංකු ජංගම ගිණුමෙහි රු.50,002,265 ක් වූ බැංකු ශේෂයක් දැක්විණි.

2.3 ආදායම් පරිපාලනය

-------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

--------------------------------------------------------------------

සභාපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ පරිදි සමාලෝචිත වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 71 | 123 | 517 |
| බදු කුලි | 844 | 2,232 | 14 |
| බලපත්‍ර ගාස්තු | 470 | 652 | - |
| වෙනත් ආදායම් | 50,111 | 48,262 | 27,276 |

2.3.2 ආදායම් අහිමිවීම

----------------------

1999 වර්ෂයේ සිට විදුලි බලය සැපයීම ලංකා විදුලිබල මණ්ඩලය වෙත භාර දි තිබුණු නමුත් සභා බල ප්‍රදේශය තුල වීථි පහන් නඩත්තු කිරිම වෙනුවෙන් පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් අයවිය යුතු රු.583,130 ක් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. එබැවින් සභාවට පාඩුවක් සිදු වි තිබුණි.

2.3.3 හිඟ ආදායම්

----------------

සමාලෝචිත වර්ෂයේ තක්සේරු බදු සහ කුලී වලට අදාළ වූ 530,752 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග හෝ නීතිමය කටයුතු කර නොතිබුණි.

2.3.4 උසාවි දඩ

------------

උසාවි දඩ, ආදායම් සහ ලැබිය යුතු මුදල් ලෙස බිල්කරන නමුත් විවිධ ආඥා පණත් යටතේ පනවන ලදුව මහේස්ත්‍රාත් උසාවි වලින් සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු රු.1,752,850 ක් මෙම වාර්තාවේ දින තෙක් ලැබී නොතිබුණි.

2.3.5 මුද්දර ගාස්තු

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛණයෙහි රු.10,000,000 ක් වූ ඇස්තමේන්තුගත ආදායමක් දක්වා තිබුණ නමුත් ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් විස්තරාත්මක මුද්දර ගාස්තු උපලේඛනයක් ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද මෙම වාර්තාවේ දින දක්වා අර්ථවත් ක්‍රියාමාර්ගයක් නොගෙන, ඇස්තමේන්තුගත මුද්දර ගාස්තුව, ආදායම් හා ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ආ) 2006 සිට 2010 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා අයවිය යුතු රු.15,843,286 ක් වූ මුද්දර ගාස්තු එම ඉහත කාලයට අදාල ආදායම් ලෙස ගිණුම් ගතකර තිබුණු නමුත්, එම මුදල් අයකර ගැනිම සඳහා මෙම වාර්තාවේ දින දක්වා කටයුතු කර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

-------------------------------

2.4.1 සමීක්ෂණය නොකළ වත්කම්

------------------------------------

වත්කම් පොත් අගය මත රු.33,174,858 ක් ලෙස ගිණුම් ගතකර තිබුණු අතර එය 2012 දෙසැම්බර් 31 දිනට වූ සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් සනාථ කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| විස්තරය | වටිනාකම |
| --- | --- |
| | රු. |
| ස්ථාවර වත්කම් | 32,899,632 |
| ගබඩා විෂයයන් | 275,226 |
| | 33,174,858 |

2.5 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවූ පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රිති, රෙගුලාසි වලට යොමුව. | | අනුකූල නොවීම් |
| --- | --- | --- | --- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත<br>V පරිච්ඡේදයේ 158(1) වගන්තිය | - | රු.517,032 ක් වූ තක්සේරු බදු හිඟයක් පැවති නමුත් ලේකම්වරයා විසින් බදු පැහැරහැරියවුන්ට වොරන්ට් නිවේදන නිකුත් කර නොතිබුණි. |
| (ආ) | ප්‍රාදේශීය සභා (මූල්‍ය සහ පරිපලන ) රීති - 1988<br>(i) III පරිච්ඡේදයේ 70 වගන්තිය | - | නියමිත කාලපරිච්ඡේදය අවසන් වූ පසු හිඟ කුලී රු.13,750 ක් ගෙවීම් පැහැර හැරි අයගේ ලැයිස්තුවක් පිළියෙල කර ආදායම් ලිපිකරු විසින් ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii) V පරිච්ඡේදයේ 140 වගන්තිය | - | රු.6,824,327 ක් වූ නිරවුල් නොකළ අත්තිකාරම් සම්බන්ධයෙන් ලේකම් විසින් නියමිත දිනයන්හි කටයුතු කර නොතිබුණි. |

(iii) VI පරිච්ඡේදයේ 05 වගන්තියේ 237 උපවගන්තිය - එකතුව රු.10,635 ක් වූ මුදල් නොකළ චෙක්පත් 5 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි -

-------------------------------------------

මු.රෙ. 571

රු.170,135 ක් වූ කල් ඉකුත් වූ කොන්ත්‍රාත්කරුවන්ගේ තැන්පතු සහ විවිධ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

| තැන්පතු පිළිබඳ විස්තර | 2010 වර්ෂය | වර්ෂ 5 කට අධික |
|---|---|---|
| | රු. | රු. |
| කොන්ත්‍රාත්කරුවන් | 98,515 | - |
| විවිධ | 56,629 | 14,991 |
| | 155,144 | 14,991 |

(ඈ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත - 2010 වර්ෂයේදි අගකරන ලද එකතු කළ අගය මත බදු රු.27,429 ක් දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඉ) 1982 අංක 03 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 27 වගන්තිය - සේවක අර්ථසාධක අරමුදලේ දායකමුදල ඊළඟ මාසයේදි සේවක අර්ථසාධක අරමුදල වෙත ප්‍රේෂණය කළයුතු නමුත් වර්ෂ 05 ක් සඳහා වූ රු.14,991 ක් වූ දායක මුදල් එසේ ප්‍රේෂණය කර නොතිබු අතර තැන්පතු ගිණුමෙහි තබා තිබුණි.

2.6 එල රහිත ගනුදෙනු

----------------------

මහනගර සභා පිට්ටනියෙහි පවත්වන ලද " දැයට කිරුළ " ප්‍රදර්ශනය සඳහා තබන ලද කීරමලේ පුණ්‍ය භූමි ආදර්ශය සඳහා දරන ලද රු.62,200 ක් වූ වියදම එල රහිත සහ සභාවේ අරමුණු වලට පරිබාහිර වූ වියදමක් ලෙස සැලකේ.

2.7 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------------

2.7.1 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම ප්‍රමාද වීම්

-------------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම ප්‍රමාද විම හේතුවෙන් ඉදිරි කාලපරිච්ඡේදයන්හි ඒ සඳහා ගෙවිම පිණිස විවිධ ණයහිමියන් යටතේ රු.8,418,397 ක් ප්‍රතිපාදනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ව්‍යාපෘතියේ නම | වෙන්කළ මුදල |
|---|---|
| | රු. |
| පෙරිය කෙන්නඩි කන්නකාර් මාර්ගය | 465,038 |
| මල්ලාකම් වෙළඳ පොළෙහි දොරක් සවිකිරිම | 58,875 |
| සෝඩා සමාගම - කෙන්කාකර් මාර්ගය | 5,280,496 |
| කොන්ක්‍රිට් මාර්ගයක් ඉදිකිරිම | 443,234 |
| මහජන ශාලාවක් ඉදිකිරිම | 247,100 |
| පිළිසරු මධ්‍යස්ථානයේ මායිම් තාප්පය | 1,787,156 |
| කොන්ක්‍රිට් මාර්ගයක් ඉදිකිරිම | 136,498 |
| | 8,418,397 |

2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------------

පළාත් පාලන කොමසාරිස්වරයා විසින් 2010 වර්ෂයේදි ප්‍රජා මධ්‍යස්ථාන 08 ක් සඳහා පරිත්‍යාග කරන ලද රු.32,000 ක් අපේක්ෂිත කාර්යයන් සඳහා යොදා නොගෙන විවිධ තැන්පතු වල රඳවාගෙන තිබුණි.

2.9 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

ඝණ අපද්‍රව්‍ය බැහැර කිරිම සඳහා මායිම් තාප්පය ඉදිකිරිමේ කටයුතු නිමකර නොතිබුණු නමුත් ගිණුම් වල ණයගැතියෝ ලෙස රු.235,195 ක මුදලක් දක්වා තිබුණි. එබැවින් 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 3 වගන්තිය ප්‍රකාරව මහජනතාවට පහසුකම් සැලසීමට සභාව අපොහොසත් වි තිබුණි.

2.10 අභ්‍යන්තර විගණනය

-----------------------------

සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති සහ පාලන

----------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ආදායම් රැස්කිරිම

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) මාසික රැස්විම් වාර්තා

(ඈ) ගිණුම්කරණය

(ඉ) මානව සම්පත්

(ඊ) පරිත්‍යාග

(උ) වාහන පරිභෝජනය

(ඌ) අයවැය පාලනය